සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

# කළුතර අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

# සිසු ප්‍රභා - අප්‍රේල්

# 5 ශ්‍රේණිය - 2025

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්‍ෂා කිරීම සඳහා පමණි.

**කළුතර අධ්‍යාපන කලාපයේ අවසරයකින් තොරව "සිසු ප්‍රභා" ප්‍රශ්න පත්‍රයේ කොටස් උපුටා ගැනීම හෝ අලෙවි කිරීම සපුරා තහනම් වේ.**

## I පත්‍රය

**පැය එකයි.**

විභාග අංකය:..................................................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ **විභාග අංකය** මේ කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසි කොළයක් සපයනු ලැබේ.


## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ : | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටියට අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බවට සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය | V/II/S/CH |

★ ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. එකිනෙකට වඩාත් සමාන රූප 02 තෝරන්න.



A



B


C

(1) A හා B (2) A හා C (3) B හා C

02. A රූපයට වඩා B රූපයේ ඇති වෙනස්කම් ගණන කීය ද?


A


B

(1) 3 (2) 2 (3) 4

● **දී ඇති කවිය ඇසුරෙන් අංක 03 සහ 04 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සරු පොළොවක් සමග අපට
සවි බල දැතක් ඇතේ
මේ රට දෙව් ලොවක් කරන
අරමුණකුත් ඇත සිතේ

03. කවියට අනුව ඇති දෙයක් සහ නැති දෙයක් පිළිවෙළින් තෝරන්න.

(1) සවිබල දැතක් - සරු පොළොවක්

(2) සරු පොළොවක් - සවිබල දැතක්

(3) සවිබල දැතක් - නිසරු පොළොවක්


04. මෙම කවියට අනුව සිතේ ඇති අරමුණ වන්නේ,

(1) සරු පොළොවක් ඇති කිරීම.

(2) රට දිව්‍ය ලෝකයක් කිරීම.

(3) හොඳින් ඉගෙන ගැනීම.

05. රූපයේ දැක්වෙන සේ ඝනක හැඩය ඇති ඝන වස්තුවක් තිත් ඉරි දිගේ කැපූ විට ලැබෙන මුහුණතේ හැඩය වන්නේ,





(1) ත්‍රිකෝණයකි
(2) සෘජුකෝණාස්‍රයකි
(3) සමචතුරස්‍රයකි

06. මිනිසුන් දෙදෙනෙක් එකම මොහොතක එකම ස්ථානයකින් එකිනෙකට ප්‍රතිවිරුද්ධ දිශාවලට ගමන් අරඹා, පළමුවෙන් මීටර 10 බැගින් ගොස් තම වම් අත පැත්තට හැරී තවත් මීටර 10 බැගින් ගමන් කළහ. අනතුරුව දෙදෙනා ම තම වම් අත පැත්තට හැරී තවත් මීටර 10 බැගින් ගමන් කළහ. දැන් ඔවුන් දෙදෙනා සිටින්නේ,

(1) එකිනෙකාට 20 m දුරින් ය. (2) එකිනෙකාට 40 m දුරින් ය.
(3) ආරම්භක ස්ථානයේ ය.


07. පහත සඳහන් වන්නේ කඩදාසියක් දෙවරක් නවා මැදින් කොටසක් ඉවත් කළ විට දැක්වෙන රූපයකි. එය දිග හැරිය විට ආ යුතු රූපය තෝරන්න.





(1) (2) (3)

08. පහත දැක්වෙන සෘජුකෝණාස්‍රයේ දිග 27 cm ද පළල 12 cm ක් ද වේ.එම සෘජුකෝණාස්‍රයෙන් පහත ආකාරයේ කුඩා ත්‍රිකෝණ කීයක් කපා ගත හැකි ද?




(1) 54 (2)27 (3) 36

09. හාල් 4kg සහ පරිප්පු 3kg සඳහා රුපියල් 980.00ක් ගෙවන ලදී. හාල් 2kg ක් රුපියල් 220.00 ක් නම් පරිප්පු 1 kg ක මිල වන්නේ,

(1) රු. 180.00 (2) රු. 220.00 (3) රු. 210.00

10. මේසයක් මත තැබූ බිත්ති ඔරලෝසුවක වේලාව උදෑසන 6.00 වන විට එහි පැය කටුව බස්නාහිර දිශාවට යොමු වී තිබුණි.එම ඔරලෝසුවේ උදෑසන 6.45 වන විට ඔරලෝසුවේ මිනිත්තු කටුව යොමු වී ඇති දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාව කුමක් ද?

(1) නැගෙනහිර දිශාව (2) උතුරු දිශාව (3) දකුණු දිශාව

11. හොඳින් ඉර පායා තිබූ දිනක දහවල් 12ට පමණ අහස දෙස බැලූ විට, ඈත අහසේ පියඹා ගිය වවුලන් රංචුවක් ම දැකගත හැකි වූ බව දින්තරු කියයි. මෙය සිදුවිය නොහැකි ය. එයට හේතුව,

(1) වවුලන් පියඹා නොගොස් පැන පැන යන නිසා ය.

(2) වවුලන්ට දිවා කාලයේ දී ඇස් පෙනීම අඩු නිසා රාත්‍රියේ කාලයේ පමණක් ආහාර සොයා යන නිසා ය.

(3) වවුලන් කපුටන්ට බිය නිසා ය.

- **අංක 12 සහ 13 ප්‍රශ්නවල මුලින් දී ඇති ප්‍රකාශය පිළිබඳ නිවැරදි නිගමනය තෝරන්න.**

12. උඩ පැන්නොත් බිම වැටේ.

(1) මෙය කිසිවිටෙකත් සත්‍ය නොවේ.

(2) මෙය සැමවිට ම සතය වේ.

(3) මෙය සමහර අවස්ථාවල දී පමණක් සත්‍ය වේ.

13. තදින් වර්ෂාව ඇති විටක විදුලි කොටමින් හා අධික ලෙස ගොරවමින් පවතියි.

(1) මෙය බොහෝ විට සිදුවන්නකි.

(2) මෙය කිසිවිටෙකත් සිදු නොවන්නකි.

(3) මෙය සැමවිට ම සිදුවන්නකි.

14. ඇපල්, දොඩම්, පේර පලතුරු වර්ග තුනක් ඇත.ලක්නුලට දොඩම් ගෙඩියක් නොලැබෙන සේ මෙම පලතුරු ලක්නුල,අහස්නා සහ සඳරු අතර බෙදා දිය හැකි එකිනෙකට වෙනස් ආකාර කීයක් තිබේ ද?

(1) 4 (2) 6 (3) 3

15. 'ගඟට ඉනි කැපුවා වගේ' යෙදුම වඩාත් විස්තරවන පිළිතුර තෝරන්න.

(1) දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් ලැබීම.

(2) අරමුණක් නොමැතිව වැඩ කිරීම

(3) දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.

16. 1 සිට 20 තෙක් හින්දු අරාබි සංඛ්‍යා ලිවීමේ දී සංකේත දහයක් යොදා ගෙන සංඛ්‍යා ලියනු ලබයි.ඒ අනුව 1 සිට 20 තෙක් සංඛ්‍යා රෝම ඉලක්කමෙන් ලිවීමට යොදා ගන්නා සංකේත ගණන කොපමණ ද?

(1) 3 (2) 20 (3) 10

17. කඩයක තිබූ පලතුරුවලින් ඇපල් මෙන් තුන් ගුණයක් දොඩම් තිබුණි.ඇපල් හා දොඩම් මිල එකිනෙක සමාන වේ.කඩයේ තිබූ ඇපල් විකුණා වෙළෙන්දා රු.200.00ක ආදායමක් ලබා ගත්තේ නම්,කඩයේ ඇති ඇපල් සහ දොඩම් සියල්ලම විකුණා ලද හැකි ආදායම කොපමණ ද?

(1) රු.600.00 (2) රු.500.00 (3) රු.800.00

18. නිවසක තීන්ත ගෑමට මිනිසෙකුට දින 24 ක් ගතවේ. එම නිවසේ තීන්ත ගෑමට මිනිස්සු 6 දෙනෙකුට පැවරුවහොත් ගතවන කාලය කොපමණ ද?

(1) දින 5 (2) දින 8 (3) දින 4

19. සඳදි 15 වැනි උපන් දිනය සැමරූ දවසේ ම ඇයගේ නංගී 11 වැනි උපන් දිනය සැමරුවා ය. සඳදි උපන් දිනය සැමරුවේ 2024 අගෝස්තු මස 09 වැනිදා නම් නංගී උපන් වර්ෂය විය හැක්කේ,

(1) 2018 (2) 2013 (3) 2012


20. සුනිමල් සිටි පෝලිමෙහි ඔහුට ඉදිරියෙන් මිනිසුන් 9 දෙනෙක් සිටියහ.ඉන් පසු පෝලිමේ අන්තිමට සිටි අය පළමුවැනියා වන සේ සියලු දෙනාම අනිත් පැත්තට හැරුණහ.එවිට සුනිමල්ට ඉදිරියෙන් සිටියේ මිනිසුන් 5 දෙනෙකු පමණි.පෝලිමේ සිටි මුළු මිනිසුන් ගණන කොපමණ ද?

(1) 14 (2) 15 (3) 16

21. **'හතළිස්දහස් විසි අට'** යන සංඛ්‍යාවේ ඉලක්කම් අග සිට මුලට ලියූ විට ලැබෙන සංඛ්‍යාවෙන් 98ක් අඩු කළ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) 40 028 (2) 82 004 (3) 81 906

22. මෙම රූපය සමචතුරස්‍රයක් කිරීමට තව කුඩා කොටු කීයක් අවශ්‍ය ද?



(1) 8

(2) 18

(3) 13

- තොරතුරු සැලකිල්ලට ගෙන අංක 23 හා 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**අන්නාසි 4 + කොමඩු 2** → **රුපියල් 400**

**අන්නාසි 3 + කොමඩු 5** → **රුපියල් 510**

23. ඉහත ඉදිරිපත් කිරීමට අනුව අන්නාසි ගෙඩියක හා කොමඩු ගෙඩියක මිල කීය ද?

(1) රුපියල් 120.00 (2) රුපියල් 150.00 (3) රුපියල් 130.00

24. අන්නාසි ගෙඩි 7 ක හා කොමඩු ගෙඩි 7 ක මිල කීයද?

(1) රුපියල් 910.00 (2) රුපියල් 750.00 (3) රුපියල් 775.00


25. රුවන් පවුලේ වැඩිමහල් දරුවා ය. ඔහුගේ මාමා සරත් ය. සරත්ට එක ම සහෝදරියකි. ඇය සුනීතා ය. සුනීතාගේ දුව කාවින්ද්‍යා ය. රුවන් සහ කාවින්ද්‍යා අතර ඇති ඥාති සම්බන්ධය වන්නේ,

(1) පුතා සහ පුංචි අම්මා

(2) අයියා සහ නංගී

(3) පුතා සහ දුව

26. පහත දාදු කැටයේ පෙනෙන පැතිවලට විරුද්ධ පැත්තේ ඇත්තේ පෙනෙන සංඛ්‍යාවේ දෙගුණය වෙයි.එම දාදු කැටය පහත ඊතල යොදා ඇති මාර්ගයේ පෙරළමින් ගිය විට අවසානයට පෙරළුණු අවස්ථාවේ සැලැස්මේ දැකිය හැකි සංඛ්‍යාව වන්නේ,,




(1) 10

(2) 6

(22) 5

27. ව්‍යාපාරිකයෙක් සෑම ඉරු දිනක ම විවේක ගනී. ඔහුට අප්‍රේල් 28 වැනිදා විවේක ගැනීමෙන් පසු නැවත විවේකයක් ගත හැකි දිනයක් වන්නේ ,

(1) මැයි 5 (2) මැයි 6 (3) මැයි 9


28. 2025 ජනවාරි 01 අඟහරුවාදා දවසකි. ඒ අනුව 2025 අප්‍රේල් 02 දිනය යෙදෙන දවස කුමක් ද?

(1) අඟහරුවාදා (2) සඳුදා (3) බදාදා

29. 35ත් 56ත් අතර ඇති සංඛ්‍යාවල 5 ඉලක්කම යෙදුණු සියලු සංඛ්‍යා එකතු කළ විට අගය වන්නේ,

(1) 135 (2) 395 (3) 360

30. සමචතුරස්‍රාකාර එළවළු පාත්තියක ඊතල යෙදූ පැති වලින් බැලූ විට කණු 6 බැගින් පෙනේ. එම ඉඩමේ පැති තුනක සිටුවා ඇති කණු ගණන කීය ද?




(1) කණු 16
(2) කණු 18
(3) කණු 24

31. පන්තියක ළමයි 12 ක් සිටිති. මෙම ළමුන්ගෙන් 6 දෙනෙක් වොලිබෝල් ක්‍රීඩාවේ යෙදෙති. 9 දෙනෙක් එල්ලේ ක්‍රීඩාවේ යෙදෙති. සමහරු ක්‍රීඩා දෙකේ ම යෙදෙති. ක්‍රීඩා දෙකේම යෙදෙන ළමුන්ගෙන් එක් අයෙක් සඳහා ක්‍රීඩා භාණ්ඩ වෙනුවෙන් රුපියල් 750ක මුදලක් වැයවේ නම් ඔවුන් සියලු දෙනා වෙනුවෙන් වැයවන මුළු මුදල කීය ද?

(1) රු.2250.00 (2) රු.3250.00 (3) රු.7250.00


32.





මෙම රූපයේ ? ඇති කොටුවට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?


(1) 14 (2) 22 (3) 11

33. පහත රූපයෙන් දැක්වෙන්නේ කාඩ්බෝඩ්වලින් සෑදූ පෙට්ටියකි.එය දිග හැරිය විට දැක්වෙන ආකාරය කුමක් ද?





(1)





(2)




(3)

34. මෙම රූපය නවා පෙට්ටියක් ලෙස සකස් කළ විට දැකිය හැකි ආකාරය කුමක් ද






(1)



(2)



(3)

35. දෙසැඳි ළඟ ඇති රතු පැන් ගණන පැන් 4,5,සහ 6 ගොඩවල් ලෙස සමාන ප්‍රමාණය බැගින් ගොඩවල් ලැබෙන සේ වෙන් කළ විට පැන් තුනක් ඉතිරි වේ.දෙසැඳි ළඟ තිබිය හැකි පැන් ගණන විය හැක්කේ,

(1) 87 (2) 78 (3) 62

36. අවුරුදු උත්සවයක සංගීත පුටු තරගයක් පැවැත්වීම සඳහා රවුමට පුටු තබා ඇත. පස්වැනි පුටුව ඉදිරියෙන් තිබුණේ පහළොස්වැනි පුටුව නම්, එහි තිබූ මුළු පුටු ගණන කීය ද?

(1) 20 කි (2) 25 කි (3) 28 කි

37. ඡායාරූපයක් අතට ගත් රංග, මෙහි සිටින්නේ මගේ පියාගේ, පියාගේ, බිරිඳගේ එකම පුතාගේ නැගණිය බව පවසයි

මේ අනුව මෙම ඡායාරූපයෙහි සිටින්නේ,


(1) රංගගේ එකම නැගණිය (2) රංගගේ එකම නැන්දණිය

(3) රංගගේ එකම පුංචි අම්මා

38. ප්‍රශ්න 10ක් ඇති ප්‍රශ්න පත්‍රයකට සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් මුළු ලකුණු 100 කි. වරදින සෑම ප්‍රශ්නයක් සඳහා ම ලබා ගත් ලකුණුවලින් ලකුණු 05ක් අඩු කරයි. නිවැරදි පිළිතුරු 8ක් සැපයූ චිතුලට ලබා ගත හැකි මුළු ලකුණු ගණන කීය ද?

(1) $\frac{80}{100}$ කි (2) $\frac{90}{100}$ කි (3) $\frac{70}{100}$ කි


39. රූප සටහන සහ තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.




A රෝදයේ වට ප්‍රමාණය, B රෝදයේ වට ප්‍රමාණය මෙන් පස් ගුණයකි.

A රෝදය වට 4ක් කරකැවෙන විට B රෝදය කරකැවිය යුතු වාර ගණන කීය ද?

(1) වට 10 කි (2) වට 20 කි (3) වට 30 කි

40. 

මෙම රූපය සමමිතික රූපයක් බවට පත් කිරීමට අවම වශයෙන් ඇඳිය යුතු රේඛා ගණන කීය ද?

(1) එකකි. (2) තුනකි (3) දෙකකි

සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

කළුතර අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

# සිසු ප්‍රභා - අප්‍රේල්

# 5 ශ්‍රේණිය - 2025

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

කළුතර අධ්‍යාපන කලාපයේ අවසරයකින් තොරව ''සිසු ප්‍රභා'' ප්‍රශ්න පත්‍රයේ කොටස් උපුටා ගැනීම හෝ අලෙවි කිරීම සපුරා තහනම් වේ.

## II පත්‍රය

**පැය එකයි. මිනිත්තු 15**

විභාග අංකය:..................................................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ **විභාග අංකය** මේ කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර** තෝරා **යටින් ඉරක්** අඳින්න.
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසි කොළයක් සපයනු ලැබේ.

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ : | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටියට අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බවට සහතික කරමි. | <br>V/II/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | <br>V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | <br>V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය | <br>V/II/S/CH |

(01) **පහත සඳහන් විරිඳු පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අනුරාපුර පොළොන්නරුව සීගිරි මන බන්දනීය
කුලුනු පිළිම බිතු සිතුවම් නන් සිතුවිලි රංජනීය
නන් සිතුවිලි රංජනීය

පස් පියුමෙන් පිරුණු පොකුණ රේණු හැලී රන් පාටය
ඉන් නැහැවී නිල් ගැන්වෙන ගොයම් තලා පින් පාටය
ගොයම් තලා පින් පාටය

වසන්තයේ හිරිමල් වන බිඟු ගී මිහිරෙන් පිරෙන්නේ
මහියංගන කැලේ හැදෙන මී වදවල පැණි පෙරෙන්නේ
මී වදවල පැණි පෙරෙන්නේ

(i) විරිඳු පෙළට අනුව ඓතිහාසික වටිනාකමක් ඇති නගර දෙකක් ගැන කියැවේ. එම නගරවලින් එකක් ලියන්න ............................................................

(ii) මෙහි සඳහන් වන ආකාරයට පොකුණු පිරී ඇත්තේ මොනවායින් ද?

..............................................................................................................................................

(iii) මී මැස්සන් හඳුන්වා දීමට විරිඳු පෙළෙහි යොදා ඇති සමානාර්ථවත් පදය කුමක් ද?

..................................................................

(iv) ''නන් සිතුවිලි'' යනුවෙන් කුමක් අදහස් වේ ද?

..............................................................................................................................................

(v) මෙහි සඳහන් වන ආකාරයට මල් පිපෙන කාලය කුමක් ද? ......................................................

(vi) බිතු සිතුවම් සඳහා ප්‍රසිද්ධ ස්ථානයක් ගැන කියැවේ. එය කුමක් ද? .........................................

(ලකුණු 1×6=6)

(02) **ඉරි ඇඳි පදය වෙනුවට සමාන පදය යොදා වාක්‍යය නැවත ලියන්න.**

අපේ සීයා දිනපතාම ගුවන්විදුලි <u>පුවෘත්ති</u>වලට සවන් දෙයි.

..............................................................................................................................................

(03) **පහත ප්‍රස්තාව පිරුළුවල හිස්තැනට ගැළපෙන වචනය යොදා සම්පූර්ණ කරන්න.**

(i) ගඟට ........................ කැපුවා වගේ.

(ii) කැකිල්ලේ ............................................. නඩු තීන්දුව වගේ.

(04) **පහත වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(i) උපාසිකාවෝ ............................ දල්වා ගාථා කීහ. (පහණ් / පහන්)

(ii) පය ලිස්සා වැටීම නිසා මාමාගේ ..................................... තුවාල විය. (දන හිස/දණ හිස)

(05) **පහත වැකි ලිඛිත බසින් ලියන්න.**

(i) සීයා පබළු ඇට දෙක තුනක් බිමට දැම්මා

..........................................................................................................

(ii) ගම්වැසියෝ වයලට් ආච්චිට ආදරය කරනවා

..........................................................................................................

(06) **පහත වාක්‍ය ස්ත්‍රීලිංග වාක්‍ය ලෙස හරවා ලියන්න.**

(i) ගොවියා උදැල්ල රැගෙන කෙතට ගියේ ය.

..........................................................................................................

(ii) වෙළෙන්දා එළවළු විකිණීමට පොළට ගියේ ය.

..........................................................................................................

(07) **පහත සඳහන් එක් එක් වගන්තියේ උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් වරහන තුළ (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

(i) උදෑසන හිරු එළියට මල් පිපෙති. ( )

(ii) දැල්පන්දු ක්‍රීඩිකාවෝ තරගයට සූදානම් වෙයි. ( )

(iii) නංගී අලංකාර චිත්‍රයක් ඇන්දා ය. ( )

(iv) අයියත් මමත් කතන්දර පොත් කියෙව්වෙමු. ( )

(08) **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වටා රවුමක් අඳින්න.**

(i) අභ්‍යාවකාෂය / අභ්‍යවකාශය (ii) පරිපථ / පරිපත

(iii) කන්ඩායම / කණ්ඩායම

(09) **පහත වාක්‍ය නිවැරදිව ගළපා ලියන්න.**

(i) ගසක් / අඹ / ඉදිරිපස / නිවස / අපේ / මිදුලේ / තිබේ.

..........................................................................................................

(ii) අර්බුදයට / අවශ්‍යය / තිරසර / ශ්‍රී ලංකාවේ / විසඳුමක් / කසළ

..........................................................................................................

(ලකුණු 1×18= 18)

(10) **එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති තිත් ඉර මත ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.**

(i) 

(ii) 

.................................................... ....................................................

(11) පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යයෙහි සිංහල අදහස ලියන්න.

(i) How many friends do you have - ..........................................................................................

(ii) I can dance - ..........................................................................................

(12) දී ඇති එක් එක් වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Caterpillar - ....................................... (ii) Canteen - ......................................

(ලකුණු 1×6=6)

★ පහත දෙමළ වැකියේ සිංහල අදහස සිංහල අකුරෙන් ලියන්න.

(13) ආසිරියර් එංගේ - ..........................................................................................

(14) උංගළ් පාඩසාලෛ එදු? - ..........................................................................................

(ලකුණු 2×1=2)

● පහත ගණිත ගැටලු විසඳන්න.

(15) ''අසූ තුන්දහස් පන්සිය අසූ දෙක '' සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. ..................................................


(16)

| | |
|---|---|
| 8 | 3 |
| 9 | 0 |

(i) කොටුව තුළ ඇති ඉලක්කම්වලින් සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව ලියන්න.

..........................................

(ii) එහි දහයස්ථානයේ සඳහන් ඉලක්කමෙන් නිරූපිත අගය ලියන්න. ..........................................

(17) 

මෙම මිදි පොකුරේ ඇති මිදි ගෙඩි ගණන රෝම සංඛ්‍යාවෙන් ලියන්න. ..........................................


(18) දී ඇති සංඛ්‍යා රටාවල ඊළඟ සංඛ්‍යාව හිස්තැන මත ලියන්න.

(i) 16, 32, 64, ............. (ii) 52, 45, 38, ..............

(19) සුපිපි තම නිවසේ සිට මීටර් 25ක් නැගෙනහිර දෙසට ගමන් කරයි. නැවත එතැන් සිට තවත් මීටර් 50ක් දකුණු දිශාවට ගමන් කර පන්සලට පැමිණෙයි. දැන් ඇය සිටින්නේ නිවසේ සිට කුමන දිශාවෙන් ද? ..........................................................

(20) කඩල 250g ක මිල රුපියල් 144 කි. කඩල 1kg 500gක මිල සොයන්න.

..........................................................

(21) 

මෙම ඝන වස්තුවේ,


(i) දාර කීයක් තිබේ ද? ..........................................

(i) ශීර්ෂ කීයක් තිබේ ද? ..........................................

(22) අමල්ගෙ යතුරු පැදියේ මීටරය සඳහන් වී තිබුණේ මෙසේ ය. තවත් 30km දුරක් ගමන් කළ පසු යතුරු පැදියේ මීටරයේ සටහන් විය යුතු ආකාරය හිස් කොටු තුළ ලියන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 0 | 0 | 9 | 9 | 9 | 0 | km |


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | km |

(23) 


ගණක රාමුවෙහි දැක්වෙන සංඛ්‍යාවට 9ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව කීය ද?

.............................................

(24) රූපයේ පාට කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



.............................................

(25) පොල් වගාබිමකින් සඳුදා දින පොල්ගෙඩි 1 456ක් ද, අඟහරුවාදා දින 4 039ක් ද එලදාව ලෙස කඩා ගන්නා ලදී. දින දෙකේදීම කඩාගන්නා ලද මුළු පොල් ගෙඩි ගණන කීය ද?

.............................................

(26) ගගුලි, සිගිති, රෂිණි යන දරුවන් තිදෙනා තම පියා විසින් දෙන ලද රු. 2 260ක මුදලින් රුපියල් 721ක් පොත් ගැනීමට වියදම් කර ඉතිරි මුදල සමසේ බෙදා ගත්තේ නම්,


(i) පොත් මිලදී ගැනීමෙන් පසුව ඉතිරි වූ මුදල කීය ද? .............................................

(ii) එක් අයෙකුට ලැබෙන මුදල් ප්‍රමාණය කොපමණ ද? .............................................

(27) මිශ්‍ර පාසලක සිටින සිසුන්ගෙන් 2/5 ක් බාලිකාවෝ ය. එහි සිටින බාලකයන් ගණන 351 කි. පාසලේ සිටින මුළු සිසුන් ගණන කීය ද?

.............................................

(28) දී ඇති තොරතුරු අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) මල්ගම්මන සිට කෝංගහවෙලට ඇති දුර කොපමණ ද? .............................................

(ii) අඩුම දුරක් ඇත්තේ කිනම් ගම් දෙකක් අතර ද? .............................................

(29) මීටර 4ක් දිග පීත්ත පටියකින් 1m 72cm ක ප්‍රමාණයක් කපා ඉවත්කර ගන්නා ලදී. ඉතිරි කැබැල්ල සමාන කොටස් තුනකට කපා ගන්නා ලදී. එම කැබැල්ලක දිග කොපමණ ද? ..............................

(2x15 = 30)

- අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් **ඉරක් අඳින්න.**

**(30) පාසල් ළමුන්ට නිල ඇඳුමක් නියම කර ඇත්තේ,**

**1. මැසීමට පහසු නිසා** **2. අලංකාර නිසා**

**3. සරල බව හා සැම දෙනාම එක ලෙස සමාන වීමට**

**(31) ශ්‍රී ලංකාවේ ජාතික උත්සවයකි,**

**1. වෙසක් උත්සවය** **2. නත්තල්** උත්සවය 3. නිදහස් උත්සවය

(32) බිත්තර නොදමන සත්ත්වයෙකි,

1. මීයා 2. කිඹුලා 3. කටුස්සා

(33) එක් කාණ්ඩයකට අයත් ඒකදේශික සතුන් අඩංගු පිළිතුර වන්නේ,


1. කළු වඳුරා, කලවැද්දා, හික්මීයා 2. ලූලා, බලයා, බුලත් හපයා

3. දියකාවා, වලිකුකුළා, සිංහයා

(34) අතීතයේ දී මුළුතැන්ගෙයි ලුණුකැට දමා තිබුණේ,

1. මැටි කෝප්පයක ය. 2. වීදුරු බෝතලයක ය. 3. පොල් කටුවක ය.

(35) පහත දැක්වෙන මැහුම් ක්‍රමය වන්නේ,



1. නැටි මැස්මය

2. දම්වැල් මැස්මය

3. පිස්මේන්තු මැස්මය

(36) ජලය අඩුවෙන් පානය කිරීම නිසා අක්‍රීය වන ඉන්ද්‍රියකි.

1. ඇස 2. කණ 3. වකුගඩුව

(37) සෞරග්‍රහ මණ්ඩලයේ විශාලතම ග්‍රහලෝකය මින් කුමක් ද?

1. සිකුරු 2. බ්‍රහස්පති 3. අඟහරු

(38) කණ්ඩායමක් ලෙස එකතු වී සමගියෙන් හා සැලසුම් සහගතව වැඩ කිරීමෙන්,

1. නොයෙක් ගැටුම් ඇති කර ගත හැකි ය. 2. විශාල වැඩක් කළ නොහැකි ය.

3. යමක් පහසුවෙන් හා ක්‍රමවත්ව කළ හැකි ය.

(39)



මෙම උපකරණය වන්නේ,

1. සෙක්කුව

2. පුන්කලස

3. සකපෝරුව

(40) ශ්‍රී ලංකාවේ පිහිටි වගුරු බිමක් නොවේ,

1. මුතුරාජවෙල 2. බූන්දල රක්ෂිතය 3. බසවක්කුලම

(41) ඇස් පෙනීම දුර්වල වීමට බලපාන විටමින් ඌණතාවය වන්නේ,

1. විටමින් B 2. විටමින් A 3. විටමින් C

(42) දිනපතා පුවත්පත්වල අවසාන පිටුවේ බොහෝ විට ඇතුළත් වන්නේ,

1. විදෙස් තොරතුරු 2. ක්‍රීඩා තොරතුරු 3. හදිසි අනතුරු

(43) අපේ ජනක්‍රීඩාවක් නොවේ,

1. පොරපොල් ගැසීම 2. පනා හැංගීම 3. කබඩි

(44) චුම්බක භාවිතා නොවන උපකරණයකි,

1. ඩයිනමෝව 2. මාලිමාව 3. විදුලි ස්ත්‍රික්කය

(45) 'පාරිභෝගිකයා' ලෙස හඳුන්වන්නේ,

1. භාණ්ඩ අලෙවි කරන්නා 2. භාණ්ඩ මිලදී ගන්නා 3. භාණ්ඩ නිපදවන්නා

(46) සුදුසු උෂ්ණත්වයක ගබඩා නොකිරීමෙන් ඉක්මනින්ම නරක් වීමට හැකි ආහාරයකි,

1. පාන්පිටි 2. සහල් 3. යෝගට්

(47) මෙම සංකේතයෙන් දැක්වෙන්නේ,

1. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම
2. ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය
3. ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය

(48) භාණ්ඩයක් ඇදගෙන යාම පහසුවන්නේ,

1. වැලි පොළොවේ 2. සුමට පොළොවේ 3. රළු පොළොවේ

(49) වැදි ජනයාගේ ප්‍රධාන ආහාරයකි,

1. හැලප 2. තලප 3. වණ්ඩු ආප්ප

(50) තමා ඉදි කළ වැවට බැස ජලය දෝතට ගෙන 'මේ මා රැස්කළ වස්තුව' යැයි තම පුත්‍රයාට පෙන් වූ රජතුමෙකි,

1. II අග්බෝ රජු 2. ධාතුසේන රජු 3. දුටුගැමුණු රජු

(51) පාසලක ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට භාවිත කළ හැකි ග්‍රන්ථයක් වන්නේ,

1. පන්ති නාම ලේඛනය 2. ලොග් සටහන් පොත 3. පන්ති වාර්තා පොත

(52) තමාගේ පදිංචිය සහතික කරවා ගැනීමට යා යුතු සේවා ස්ථානය,

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2. තැපැල් කාර්යාලය
3. ග්‍රාම සේවා නිලධාරී කාර්යාලය

53. දකුණු පළාතේ පිහිටි ඓතිහාසික ස්ථානයකි,

1. සමනල පාලම 2. ලබුදූව ගොවිපොළ 3. ගාලු කොටුව

54. බීජ හා දඬු යොදා ගනිමින් පැළ කරගන්නා ශාකයකි,

1. කරවිල 2. නිවිති 3. බිලිං

55. පාපැදියක් ගමන් කරවීම සඳහා පැඩලයට යොදවන බලය වන්නේ,

1. සුළං බලය 2. ඉන්ධන බලය 3. මිනිස් බලය

56. පස්වල සිටින කුඩා සතුන් නිරීක්ෂණය සඳහා භාවිත කළ හැකි උපකරණයකි,

1. මාලිමාව 2. දුරේක්ෂය 3. අත්කාචය

57. එක් වරක් පමණක් මල් හට ගන්නා ශාකයකි,

1. පොල් ගස 2. කෙසෙල් ගස 3. මොර ගස

58. 'ගිරින් ගිරට පැන ලැගුම් සොයා .........' පද පෙළ අයත් වන්නම වන්නේ,

1. හනුමා වන්නම 2. ගජගා වන්නම 3. මුසලඩි වන්නම

59. දියවැඩියා රෝගය ඇති වීමට ප්‍රධානතම හේතුව වන්නේ,

1. අධික ලෙස ජලය පානය කිරීමයි.
2. තෙල් අධික ආහාර ගැනීමයි.
3. අධික පැණිරස හා පිෂ්ටය අඩංගු ආහාර ගැනීමයි.

(ලකුණු 30)

(60) මිනිසාට යහපත් ජීවිතයක් ගත කළ හැක්කේ පරිසරය ආරක්ෂා වුවහොත් පමණි. ''පරිසරයට ආදරය කරමු'' යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්තාඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

i. ..........................................................................................................

..........................................................................................................

ii. ..........................................................................................................

..........................................................................................................

iii. ..........................................................................................................

..........................................................................................................

(ලකුණු 2 x 3 =6)

**සිසු ප්‍රභා -අංක 03 අනාවරණ පරීක්ෂණය - 5 ශ්‍රේණිය -2025 -අප්‍රේල්**

I පත්‍රය - පිළිතුරු

## I පත්‍රය - පිළිතුර

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (02) | 1 | (03) | 3 | (04) | 2 | (05) | 2 | (06) | 1 | (07) | 2 |
| (08) | 1 | (09) | 1 | (10) | 3 | (11) | 2 | (12) | 2 | (13) | 1 | (14) | 1 |
| (15) | 3 | (16) | 1 | (17) | 3 | (18) | 3 | (19) | 2 | (20) | 2 | (21) | 3 |
| (22) | 2 | (23) | 3 | (24) | 1 | (25) | 2 | (26) | 1 | (27) | 1 | (28) | 1 |
| (29) | 3 | (30) | 1 | (31) | 1 | (32) | 1 | (33) | 2 | (34) | 2 | (35) | 2 |
| (36) | 1 | (37) | 2 | (38) | 3 | (39) | 2 | (40) | 1 | | | | |

## II පත්‍රය - පිළිතුරු

01. (i) අනුරාධපුරය / පොළොන්නරුව
    (ii) පස් පියුමෙන්
    (iii) බිඟු
    (iv) විවිධ අදහස් / නොයෙක් හැඟීම්
    (v) වසන්තයේ / වසන්ත කාලයේ
    (vi) සීගිරිය
02. අපේ සීයා දිනපතාම ගුවන්විදුලි පුවත්වලට සවන් දෙයි
03. (i) ඉනි (ii) රජ්ජුරුවන්ගේ
04. (i)පහන් (ii) දණ හිස
05. (I) සීයා පබළු ඇට දෙක තුනක් බිමට දැම්මේ ය.
    (ii) ගම්වැසියෝ වයලට් ආච්චිට ආදරය කරති.
06. (i) ගෙවිලිය උදැල්ල රැගෙන කෙතට ගියා ය.
    (ii)වෙළෙන්දිය එළවළු විකිණීමට පොළට ගියා ය
07. (i) X (ii) X (iii) ✓ (iv) ✓
08. (i) අභ්‍යවකාශය (ii) පරිපථ (iii) කණ්ඩායම
09. (i) අපේ නිවස ඉදිරිපස මිදුලේ අඹ ගසක් තිබේ.
    (ii) ශ්‍රී ලංකාවේ කසළ අර්බුදයට තිරසර විසඳුමක් අවශ්‍යය .
10. (i) Rainbow (ii) Crown
11. (i) ඔබට මිතුරන් කොපමණ සිටිනවා ද?
    (i) මට නටන්න පුළුවන්
12. (i) දළඹුවා (ii) ආපණ ශාලාව
13. ගුරුවරයා / ගුරුතුමා කොහේ ද?
14. ඔබේ පාසල කුමක් ද?
15. 83 582
16. 3 089 (ii) 80
17. xv
18. 128 , 31
19. ගිනිකොන දිශාවෙන්
20. රුපියල් 864.00
21. (i) 6 (ii) 4.
22. | 0 | 1 | 0 | 0 | 2 | 0 | km |
23. 4 212
24. 0.5
25. 5 495
26. (i) 1 539. 00
    (ii) 513
27. 585
28. 25 km (ii) කෝංගහවෙල සිට ගොරකවත්තට
29. 76 cm

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (30) | 3 | (31) | 3 | (32) | 1 | (33) | 1 | (34) | 3 | (35) | 2 |
| (36) | 3 | (37) | 2 | (38) | 3 | (39) | 3 | (40) | 3 | (41) | 2 |
| (42) | 2 | (43) | 3 | (44) | 3 | (45) | 2 | (46) | 3 | (47) | 2 |
| (48) | 2 | (49) | 2 | (50) | 2 | (51) | 2 | (52) | 3 | (53) | 3 |
| (54) | 2 | (55) | 3 | (56) | 3 | (57) | 2 | (58) | 1 | (59) | 3 |